**ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1. **තත්ත්වාගණනය කළ මතය**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ඔක්තෝබර් 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 2.1(අ), (ආ) ,(ඇ), (ඉ) , 2.3, 2.5 (ඌ),(එ ),(ඉ),(ඊ),(උ),(ඌ),ඡේදවල නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වෙනත් ආයතන වෙනුවෙන් අදායම් සංකේත 4 ක් යටතේ දෙපාර්තමේන්තුව විසින් රැස්කරන ලද, එකතුව රු.1,024,621,786 ක් වූ ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ වෙනත් ලැබීම් ලෙස දක්වා නොතිබීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මුළු ලැබීම් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය සකස් කිරීමේදී (253) ආදායම් ගණන් දීමේ නිලධාරි සංකේතාංකය යටතේ වන ආදායම් ඇස්තමේන්තු පමණක් සැලකිල්ලට ගනී. නිරීක්ෂණයේ සඳහන් ආදායම් සංකේතාංකයන්ගේ ආදායම් ගණන්දීමේ නිලධාරි භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වන බැවින් එම ආදායම් වෙනත් ලැබීම් වශයෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කරනු නොලැබේ. | වෙනත් ආයතන වෙනුවෙන් රැස්කරන ලද ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ වෙනත් ලැබීම් ලෙස දැක්විය යුතුය |

### 1.6.2 පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය සඳහා වූ දේශීය හා විදේශීය ගමන් වියදම් රු.2,397,956 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම යටතේ දැක්විය යුතු වුවත්, එම වියදම වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ වියදම් යටතේ දැක්වීම හේතුවෙන් එම වටිනාකමකින් වැටුප්, වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ වියදම වැඩියෙන් ද, අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම අඩුවෙන්ද නිරූපණය කර තිබුණි. | දේශීය ගමන් වියදම් (1101) සහ විදේශීය ගමන් වියදම් (1102) වැටුප් වේතන හා අනෙකුත් සේවක ප්‍රතිලාභ යටතේ දක්වා ඇත. | දේශීය හා විදේශීය ගමන් වියදම් අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම යටතේ දැක්විය යුතුය. |

## 1.6.3 දේපල පිරියත හා උපකරණ

-----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට, ස්ථාවර වත්කම් 2 ක සිගාස් වැඩසටහන අනුව වටිනාකම රු. 59,767,636 ක් සහ මූල්‍ය ප්‍රකාශ අනුව එම වටිනාකම රු. 74,977,453 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශය අනුව වටිනාකම රු. 15,209,817 ක් වැඩියෙන් ද ස්ථාවර වත්කම් 4 ක සිගාස් වැඩසටහන අනුව වටිනාකම රු. 125,931,241 ක් හා මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම රු.102,556,055 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම රු.23,375,186 ක් අඩුවෙන් ද දක්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන හා සිගාස් වැඩසටහන අතර ස්ථාවර වත්කම් වල රු.8,165,369 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස නිවැරදි කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් ලද උපදෙස් අනුව කටයුතු කර ඇති බැවින් 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදී මෙය නිවැරදි වේ. | සිගාස් වැඩසටහන තුල ඇති ස්ථාවර වත්කම් මොඩියුලය අනුව වටිනාකම සහ මූල්‍ය ප්‍රකාශ අනුව වටිනාකම සමාන වියයුතුය. |

## 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අංක 891 (1) අනුව ඇප ලේඛනයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2019/09 අනුව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙතින් උපදෙස් විමසා ඇප ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචන

--------------------

## 2.1. ආදායම් කළමනාකරණය

--------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් සංකේත අංක 20:04:01:00 යටතේ සමාලෝචිත වර්ෂය තුලදී රු. 13,563,414 ක් වූ ආපසු ගෙවන **ලද ආදායම්** තහවුරු කර ගැනීම සඳහා 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) වගන්තිය ප්‍රකාරව 2021 ජූනි මාසය දක්වාම අදාල ආයතනවලින් හර නිවේදන ලබා ගෙන නොතිබුණි.<br>. | ආදායම් ගිණුමට හර කිරීම් සම්බන්ධව අදාල ආයතන වලින් හර නිවේදන ඉල්ලා යවා ඇති අතර කම්කරු, මිනින්දෝරු හා කෘෂිකර්ම දෙපාර්තමේන්තු, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, කුරුණෑගල, පොළොන්නරුව හා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මේ වන විටත් හර නිවේදන එවීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව හර නිවේදන ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට අයත් ආදායම් සංකේත සඳහා අදාල මාසික වාර්තා එළඹෙන මාසයේ 10 දිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතු වුවත් ආදායම් සංකේතාංක 20:04:01:00 සඳහා මාස 07 ක මාසික කාර්යසාධන වාර්තා දින 41 ත් 107 ත් අතර කාල පරාසයක ප්‍රමාදයන් සහිතව ඉදිරිපත් කර තිබුණි. | මාසික වාර්තා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ සමඟ සැසඳීමෙන් අනතුරුව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන අතර එම මාසික භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වෙත මුදා හැරීම සිදුවන්නේ බලපවත්වන මාසයට පසු මාසයේ 14 - 17 දින පරාසය තුලදී වීමද, ගෝලීය COVID 19 වසංගතය හේතුවෙන් 2020 වර්ෂය පුරා අඛණ්ඩව රාජකාරී සිදු කිරීම බිඳ වැටීම ද මීට හේතු විය. | චක්‍රලේඛ ප්‍රකාරව මාසික කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව . |
| (ඇ) | ආදායම් සංකේත අංකය 20:04:02:00 යටතේ පළාත් සභා වලින් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් ලැබීම් හා හිඟ දායක මුදල් ආයතන අනුව මෙන්ම දායකයන් අනුව, නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි සුදුසු දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි. පළාත් පාලන ආයතන විසින් හිඟ ආදායම ලෙස වාර්තාකර තිබූ වටිනාකම් මූල්‍ය ප්‍රකාශ වල හිඟ | පිළිගනිමි. සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ මූලික තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදයක් ඔස්සේ දත්ත ඇතුලත් කල හැකි වැඩසටහනක් 2017 ඔක්තෝබර් මස සිට හඳුන්වා දී ඇත. නමුත් රාජ්‍ය අංශයේ අනෙකුත් ආයතන වල සහයෝගය නොමැති වීමෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම අකර්මණ්‍ය වී ඇත. මේ වන විට වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු | දායකයින් හා දායක ගෙවීම් පිළිබඳ දත්ත පද්ධතියක් සම්බන්ධිත ආයතනවල සහයෝගය ඇතිව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගැනීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු. 823,984,589 ක් වූ හිඟ ආදායමෙහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම නොහැකි **විය.** තවද සමාලෝචිත වර්ෂය තුළදී රැස් කරන ලද රු.11,021,652,894 ක් වූ දායක ලැබීම් දායක ගිණුම් අනුව වෙන්කර හදුනා ගත නොහැකි විය. ඒ අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ගෙවීමේදී හා දායක මුදල් ආපසු ගෙවීමේදී දායක මුදල් ඒ ඒ පුද්ගලයාගෙන් අඛණ්ඩව ලැබුණේද යන්න දෙපාර්තමේන්තුව තුළින් සනාථ කර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම හිඟ ආදායම් අප්‍රමාදව අය කර ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සකස් කිරීමටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. | දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තර පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීම සම්බන්ධයෙන් 2020/12/31 දිනැති 03/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා පැරණි සාමාජිකයින් මාර්ගගත ක්‍රමය ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම සම්බන්ධව 2021/02/10 දිනැති 26/2017(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය නිකුත් කර ඇත. ඒ අනුව දායක මුදල් ආපසු ගෙවීම් යනාදී ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව, අඛන්ඩව ලැබුනේද යන්න තහවුරු කර ගත හැකි වේ. | |
| (ඇ) | 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියළුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන විට සෑම මාසයකම අයකිරීම් ඊළග මාසයේ 15 දිනට පෙර ගෙන්වා ගැනීමට කටයුතු කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා 5 ක් විසින් අවස්ථා 29 කදී දින 15 සිට දින 96 දක්වා කාල ප්‍රමාදයක් සහිතව එවා තිබූ අතර, දකුණු පළාත් සභාව හා ඌව පළාත් සභාව විසින් එක් එක් මාසයන් සඳහා අදාළ දායක මුදල් එවීමේ දී, එකවර එවීමකින් තොරව කොටස් වශයෙන් එවීම නිසා නියමිත දිනට වඩා දින 16 ත් 132 ත් අතර කාල ප්‍රමාදයක් සහිතව එවා තිබූ අවස්ථා 20 ක් ද නිරීක්ෂණය විය. | දායක මුදල් වෙන් කරන්නේ වැටුප් ගෙවන අවස්ථාවේදී බැවින් ඊළඟ මාසයේ 20 වන දින දක්වා කල් ලබාදීමක් සිදු කර ඇත. ලිපි මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ආණ්ඩුකාර ලේකම්වරුන් හා පළාත් ප්‍රධානීන් අවස්ථා ගණනාවකදීම දැනුවත් කර ඇත. දකුණ හා ඌව පළාත් සභාවල රාජ්‍ය ආයතනයන්ගේ වැන්දඹු අනත්දරු දායක මුදල් මාසික ගිණුම් සාරාංශ ඔස්සේ එකතු කර තනි චෙක්පතක් ලෙස ප්‍රේෂණය කල යුතු වුවද මාසික ගිණුම් සාරාංශයන්හි දෝෂ නිවැරදි කරන තෙක් ඇස්තමේන්තු අගය ප්‍රේෂණය කර දෝෂ නිවැරදි කර ඉතිරි මුදල ප්‍රේෂණය කරනු ලැබේ. | නියමිත දිනට දායක මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු බව . |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතනවලින් 2009 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව අයවිය යුතු හිඟ ගොඩනැගිලි කුලිය රු.24,605,333 ක් විය. මෙම කුලී ගෙවීම සඳහා අදාළ කුලී ගිවිසුම් හෝ මාසිකව නිකුත් කරන ලද ඉන්වොයිස් හෝ වෙනත් ලියවිලි පිටපත් ඉදිරිපත් කරන ලෙස ඉහත ආයතන විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර තිබුනද එබඳු ලියවිලි ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ගොඩනැගිලි සංකීර්ණයේ අයිතිය රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සතුව පැවති අවධියේ මෙම ආයතන කුලී පදනම මත පවත්වාගෙන යාම ආරම්භ කර ඇත. 2006 නොවැම්බර් 01 දින සිට ගොඩනැගිලි සංකීර්ණයේ අයිතිය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇතත් ඉහත ආයතන සමඟ පැවති කුලී ගිවිසුම්, හිඟ මුදල් වලට අදාල ලේඛන යනාදිය ලබා දී නොමැත. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මෙම ආයතන සමඟ ගිවිසුම්ගත වීමක් සිදු නොවුණු බැවින් දෙපාර්තමේන්තුව සතුව කුලී ගිවිසුම් නොමැති බව දන්වමි. | 2006.11.01 දින සිට ගොඩනැගිලි සංකීර්ණයේ අයිතිය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පවරා දුන් අවස්ථාවේදී කුලී ගිවිසුම් සහ හිඟ මුදල් වලට අදාල ලේඛන හා තොරතුරු රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා ගත යුතු වීම සහ හිඟ ගොඩනැගිලි කුලිය අය කර ගැනීමට කටයුතු කල යුතු බව . |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට , පරිශ්‍රයේ කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන 7 ක් විසින් ගෙවිය යුතු හිඟ කුලී ආදායමේ එකතුව රු. 2,036,600 ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව හිඟ කාලපරිච්ඡේදය වසරකට වැඩි වටිනාකම රු.299,000 ක් විය. | 2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කාර්යාලය පිහිටි මාළිගාවත්ත ප්‍රදේශය මාස හතරකට අධික කාලයක් හුදකලා කර තිබූ නිසා කුලී පදනම මත පවත්වාගෙන යන ආයතනයන්හි කාර්යාල කටයුතු සිදු නොවූ බැවින් කුළී මුදල් 2020 දෙසැම්බර් 31 දින වන විට ගෙවීමට නොහැකි විය. | හිඟ ගොඩනැගිලි කුලිය අය කර ගැනීමට කටයුතු කල යුතු බව . |

## 2.2. බැරකම් හා බැඳීම්වලට එළඹීම
--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| | 2020 වර්ෂයේදී පාරිතෝෂික ගෙවීම් සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් භාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම හෝ මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීමක් සිදු නොකරන ලදි. | ඉතිරි ප්‍රතිපාදනය නොඉක්මවන පරිදි බැරකම පවත්වා ගත යුතු බව . |

## 2.3. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

----------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාළව වියදම් දැරීමේ හා ආදායම් එකතු කිරීමේ බලය පැවරීම මුදල් රෙගුලාසි අනුව සිදු කර විගණකාධිපති වෙත දන්වා ඇති අතර විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳව හා අභ්‍යන්තර පාලනය පිළිබඳ සමාලෝචනයන් සිදුකර කලින් කලට අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි අත්‍යවශ්‍ය වෙනස්වීම් සිදුකර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, 2020 මුදල් වර්ෂයට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් 17 කට පිළිතුරු ලබා දී නොතිබුණු අතර එම විගණන විමසුම් වලට අදාළ පැහැදිලි කිරීම් සඳහා ඉදිරිපත් කරන ලද වටිනාකම රු 45,980,603 ක් වී තිබුණි. | විගණන විමසුම්වලින් පෙන්වා ඇති අඩුපාඩු අනෙකුත් රාජ්‍ය ආයතනයන් වෙත දන්වා නිවැරදි කිරීමෙන් පසුව පිළිතුරු ලබා දිය යුතු වීම සහ , කොවිඩ් 19 වසංගත තත්වය තුළ අවම කාර්ය මණ්ඩලයක් සේවයට කැඳවීම ආදී හේතු මත පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රමාද වීම මත කාල පමාවක් පවතින බව පිළිගනිමි. පිළිතුරු සපයා නොමැති විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට කටයුතු කරමි. | -එම- |

## 2.4. නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) 2015 සැප්තැම්බර් 14 දින හා 2011 නොවැම්බර් 04 දිනැති අංක 09/2015 හා 08/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ | වර්තමාන ලිපිනයන් පිළිබඳ තොරතුරු නොමැති වීම හා බාල වයස්කරුවා වෙත කිහිප වරක් ලිපි මඟින් දන්වා සිටිය ද පාස්පොත භාර ගැනීමට පැමිණ නොතිබීම යන කරුණු මත තිඹිරිගස්යාය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා යටිනුවර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක බාල වයස්කරුවන් 22 ක ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබියදීත් බාල වයස්කරුවන් පාස්පොත් අදාල පුද්ගලයන් වෙත භාර දී නොතිබුණි. එයින් පාස් පොත් 20 ක යාවත්කාලීන කරන ලද දිනයන්ට අදාලව එකතු වටිනාකම රු.2,145,720 ක් වී තිබුණි. | මෙම බාලවයස්කරුවන්ගේ වර්තමාන ලිපිනයන් පිළිබඳ තොරතරු ග්‍රාම නිලධාරීන් සහ බැංකු මගින් ලබා ගෙන ගිණුම් හිමියන්ට පාස්පොත් භාර දීමට කටයුතු කරන බව ද, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන්ගේ පාස්පොත් භාරදීමට ලිපි මඟින් දන්වා ඇති බවද, පාස්පොත් භාර ගැනීමට පැමිණෙන ලෙස කිහිප වරක් ලිපි මඟින් දන්වා සිටිය ද මේ වන තෙක් පැමිණ නොමැති බවද, අදාල ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් දන්වා ඇත | වයස අවුරුදු 18 සම්පූර්ණ වී ඇති පුද්ගලයන්ගේ වර්තමාන ලිපිනයන් පිළිබඳ තොරතරු ග්‍රාම නිලධාරීන් සහ බැංකු මගින් ලබා ගෙන අදාල ගිණුම් හිමියන්ට පාස්පොත් භාර දීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2013 දෙසැම්බර් 03 දිනැති හා අංක 6/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2011 ජුනි 14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 02 | නොගෙවූ විශ්‍රාම වැටුප් නියමිත මාසයට පසු මාසයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු වුවත් එසේ නොකර තිඹිරිගස්යාය හා හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාම වැටුප් අංශ විසින් රු.1,848,838 ක මුදලක් මාස 07 සිට මාස 14 දක්වා කාලයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | පොදු තැන්පත් ගිණුමේ තිබූ විශ්‍රාම වැටුප් එවා ඇති බව හා ඉදිරියේදී නියමිත දිනට එවීමට කටයුතු කරන බව තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින්ද , ගෙවන ලද මුදල් බැංකු වෙතින් ආපසු එවීමට කාලයක් ගතවන බැවින් මාස 03 ක් ඇතුළත දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කරන බව හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් විසින්ද දන්වා ඇත. | නොගෙවූ විශ්‍රාම වැටුප් නියමිත මාසයට පසු මාසයේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවීමට කටයුතු කළ යුතුය. |

## 2.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු

-------------------------------

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරී නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** 2011 මැයි 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 04/2011, 2012 දෙසැම්බර් 20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 05/2012 සහ 2014 නොවැම්බර් 03 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 13/2014 යන චක්‍රලේඛ අනුව විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා විට ඒකාබද්ධ වැටුපට පමණක් අන්තර් දීමනාව ගෙවිය යුතුය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරනය කරගත් කරුණු අනුව ඊට පටහැනිව කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි විශ්‍රාමිකයින් 03 දෙනෙකු සඳහා අන්තර් දීමනාව ලෙස වැඩිපුර ගෙවා තිබුණු වටිනාකමෙන් 2021 ජූනි 30 දිනට රු. 867,317 ක් හිඟ හිට තිබූ අතර වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකයන් 03 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු. 623,750 ක් වූ අන්තර් දීමනාව 2021 ජූනි මස වන තෙක් අය කර නොතිබුණි | කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වැඩිපුර ගෙවන ලද අන්තර් දීමනාව පහත පරිදි අය කිරීමට කටයුතු කර ඇත.<br><br>**<u>22- / 01-801214</u>**<br><br>2020 නොවැම්බර් මස සිට රු. 6,951.46 ක මාසික වාරික බැගින් අය කරමින් පවතී. .තවදුරටත් අය කිරීමට ඇති මුදල රු.356,888 කි.<br><br>**<u>01-800947/ 12-801996</u>**<br><br>2020 ඔක්තෝබර් මස සිට රු. 6,930.62 ක මාසික වාරිකය බැගින් අය කරමින් පවතී. 2021 ජූනි මස 30 දින වන විට තවදුරටත් අය කිරීමට ඇති මුදල රු.357,055 කි.<br><br>**<u>21-800010 / 12-1770</u>**<br><br>2020 ඔක්තෝබර් මස සිට රු. 5,791.67 ක මාසික වාරිකය බැගින් අය කරමින් පවතී. 2021 ජූනි මස 30 දින වන විට තවදුරටත් අය කිරීමට ඇති මුදල රු.156,374 කි.<br><br><u>වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u><br><br>විමසුමේ සඳහන් විශ්‍රාමිකයන් වෙත වැඩිපුර ගෙවන ලද අන්තර් දීමනාව අය කිරීමට වාරික තීරණය කිරීම සඳහා යොමු කර ඇත | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය වැඩි දියුණු කළ යුතු අතර මුදල් රෙගුලාසි 103 ,104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගතයුතුබව. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරනය කරගත් කරුණු අනුව මියයාම් ප්‍රමාද වී දැනුම්දීම මත විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සිදු වි ඇත්ද යන්න පරීක්ෂා නොකිරිම හේතුවෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් විශ්‍රාමිකයකු සඳහා රු. 352,030 ක විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණ අතර විගණන දිනය වන විටත් එම වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් මුදල නැවත ගෙවීමට කටයුතු කරන මෙන් 2021.01.06 දින උරුමකරුවන් වෙත ලිපි මඟින් දන්වා ඇත | -එම- |
| **(ඇ)** | විශ්‍රාමිකයා මිය ගිය පසු දැනුම් දීම ප්‍රමාදවිම හේතුවෙන් විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබූ නමුත් ඒ ටී එම් කාඩ්පත මගින් මුදල් ලබා ගැනීම සහ බැංකු ගිණුම බද්ධ ගිණුමක් වීම නිසා වෙනත් පුද්ගලයින් විසින් අයථා ලෙස එම මුදල් ලබා ගැනීම වැනි අවස්ථාවල බැංකු ගිණුමේ මුදල් නොමැති වීම නිසා වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවස්ථා 16 කදී වටිනාකම රු. 1,125,600 හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව අවස්ථා 13 කදී වටිනාකම රු 1,779,112 ක් ලෙස එකතු වටිනාකම රු. 2,904,712 ක් 2020 දෙසැම්බර් 30 දිනට මෙසේ අයථා පරිද මුදල් ලබා ගත් පුද්ගලයින් ගෙන් අයකර ගැනීමට පැවති බව නියදි විගණන පරීක්ෂාවලදී අනාවරනය විය . | බැංකු විසින් විශ්‍රාමිකයන්ට ලබා දී ඇති ණය සඳහා ඉදිරි වාරිකද එම විශ්‍රාමිකයන්ගේ වැටුපෙන් අය කර ගැනීම හේතුවෙන් මියගිය විශ්‍රාමිකයන්ගෙන් අයවිය යුතු මුදලින් 50% ක් පමණ අය කරගෙන ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අයවිය යුතු මුදල් අය කර ගැනීමට අදාල බැංකු වෙත ලිපි යවා ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | -එම- |
| **(ඈ)** | විශ්‍රාමිකයා මිය ගිය පසු දැනුම් දීම ප්‍රමාදවිම හේතුවෙන් විශ්‍රාම වැටුප්/වැන්දඹු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා ඇති අවස්ථාවලදි ගිණුමේ මුදල් පවතීනම් නැවත එවන ලෙස අදාල බැංකුව වෙත දන්වා යවා තිබුණද බැංකුව විසින් පිළිතුරු එවා නොතිබුණු අවස්ථාවල මුදල අය කර ගැනීමට ඉදිරි පියවර ගත යුතු වේ. කෙසේ වුවද නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ පරිදි තිඹිරිගස්යාය සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ලේකම් කාර්යාල වල අවස්ථා ගණන 94 කදී වැඩිපුර ගෙවා තිබූ නමුත් අයකර ගැනීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබූ හිඟ මුදල රු. 8,643,512 ක් වී තිබුණි. | තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බැංකු විසින් විශ්‍රාමිකයන්ට ලබා දී ඇති ණය සඳහා ඉදිරි වාරිකද එම විශ්‍රාමිකයන්ගේ වැටුපෙන් අය කර ගැනීම හේතුවෙන් මියගිය විශ්‍රාමිකයන්ගෙන් අයවිය යුතු මුදලින් 50% ක් පමණ අය කරගෙන ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත.<br><br>ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි මියගිය විශ්‍රාමිකයන්ගෙන් | -එම- |

| | | | |
|---|---|---|---|
| | මෙයින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩි පුර ගෙවීම් සිදුවී ගත ව තිබූ කාලය වසර 1 ත් 4 ත් දක්වා වී තිබුණි. | අයවිය යුතු මුදල් අය කර ගැනීම සඳහා අදාල බැංකු වෙත ලිපි යවා ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | |
| **(ඉ)** | ජීවිත සහතික ඉදිරිපත් නොකිරීම නිසා 2018 ජූලි සහ 2019 ජූනි මාසවල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාම වැටුප් නතර කරන ලද විශ්‍රාමිකයින් පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂාවේදී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් දෙදෙනෙකු සහ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් තිදෙනෙකු මිය යාම හේතුවෙන් ජීවිත සහතික ඉදිරිපත් කර නොතිබුණි. විශ්‍රාමිකයා මියයාම ග්‍රාම නිලධාරී හෝ පවුල්වල ඥාතීන් විසින් වැටුප් අංශය වෙත දැනුම් නොදීම හේතුකොට ගෙන මියගිය දින සිට ප්‍රධාන කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් නතර කරන තෙක් එකතු වටිනාකම රු.2,068,762 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි . එසේ වැඩිපුර ගෙවූ මුදල් හඳුනාගෙන මුදල් රෙගුලාසි 103,104 ප්‍රකාරව කටයුතුකර නැවත අය කරගැනීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි | තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2019 වර්ෂයේ ජීවිත සහතික ලබා නොදුන් විශ්‍රාමිකයින් 2020 වර්ෂය තුළ තවදුරටත් ජීවිත සහතික ලබා නොදුන්නේ නම් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් නතර කිරීමට අපේක්ෂා කළද පවතින COVID 19 වසංගත තත්වය හමුවේ සංචරණ සීමා පැවති බැවින් ඒ හරහා ජීවිත සහතික ලබා ගැනීමේ ප්‍රායෝගික ගැටළු මතු වූ බැවින් විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප අත්හිටුවීමට කටයුතු නොකරන ලදී. | -එම- |
| **(ඊ)** | යටිනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ අංක 0-40-3031/0-06-3031 දරන විශ්‍රාමිකයාට 2015 නොවැම්බර් 01 සිට 2020 මාර්තු 31 දක්වා වැඩිපුර ගෙවන ලද අන්තර් දීමනාව රු.75,250 ක් වූ අතර 2021 ජූනි මස සිට රු. 1,500 බැගින් අය කිරීමට දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති අතර තවදුරටත් අයකරගතයුතු මුදල රු. 73,750 වී තිබුණි. | වැඩිපුර ගෙවන ලද අන්තර් දීමනාව 2021 ජූනි මස සිට රු.1,500 බැගින් අය කිරීමට දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත. | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය වැඩි දියුණු කළ යුතු අතර මුදල් රෙගුලාසි 103,104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගතයුතු බව. |
| (උ) | ගලවට කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් මියගිය විශ්‍රාමිකයකු වෙනුවෙන් ගෙවා තිබූ රු. 93,600 ක් වූ වැඩිපුර ගෙවීම් වලින් 2021 ජූලි 01 දිනට රු. 72,600 ක් තවදුරටත් අයකර ගත යුතුව පැවතුණි. | විශ්‍රාම වැටුප් අංක බී.ඩී.ඇග්නස් මියගෙන් අයවිය යුතු රු. 93,600 ක මුදල ඇයගේ උරුමකරුවන් විසින් මාසිකව රු.5,000 බැගින් ගෙවීමට කටයුතු කරන බැවින් 2021.07.01 දිනට ගෙවා ඇති මුදල රු.21,000කි. තවදුරටත් අය විය යුතු මුදල රු.72,600කි. | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි මිය යන විශ්‍රාමිකයන්ගේ තොරතුරු කඩිනමින් වාර්තා වනසේ වැඩ පිළිවෙලක් සකස් කර ගත අතර මුදල් රෙගුලාසි 103 ,104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගතයුතුබව. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර විශ්‍රාමික ලිපිගොනුව මාරුකර තිබුණද දත්ත පද්ධතිය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් ගඟවට කෝරලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් විශ්‍රාමිකයකු සඳහා 2004 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා විශ්‍රාම වැටුප් අංක 01-603037 සහ 01-1603037 යටතේ විශ්‍රාම වැටුප් දෙකක් සාවද්‍ය ලෙස ගෙවා තිබුණි. මු.රෙ 104 පරීක්ෂණය මගින් 2008 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා වැඩිපුර ගෙවන ලද මුදල රු. 2,169,551 ලෙස තක්සේරු කර තිබුණ නමුත් 2008 වර්ෂයට පෙර වූ මාස 41 ක කාලයක් සඳහා වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම ගණනය කර නොතිබුණි**.** මෙම විශ්‍රාමිකයා 2021 මාර්තු 02 දින මිය ගොස් තිබූ අතර විශ්‍රාම වැටුප නතර කල දින සිට මියගිය දිනය දක්වා ඔහුගෙන් අයකරගත් මුදල් අඩු කල පසුව තවදුරටත් රු.1,839,320 කට අධික මුදල අයකර ගැනීමට පැවතුණි**.** | ද්විත්ව විශ්‍රාම වැටුප ගෙවීම සම්බන්ධයෙන් මු.රෙ .104 අනුව පරීක්ෂණයක් සිදු කර වැඩිපුර ගෙවන ලද මුදල රු.2,169,551ක් ලෙස තක්සේරු කර ඇත. 2019 දෙසැම්බර් මස සිට විශ්‍රාම වැටුප් ගෙවීම නවතා ඇති අතර විශ්‍රාමිකයා 2021 මාර්තු 02 දින මිය ගොස් ඇත. ඒ අනුව තවදුරටත් අය වීමට ඇති මුදල රු.1,839,320.20 ක් වන අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ගෙවීමේදී අය කිරීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත | විශ්‍රාම වැටුප් ගොනුවක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර මාරු කරන සෑම අවස්ථාවකදීම දත්ත පද්ධතිය යාවත්කාලීන වේ දැයි නිරන්තර පරීක්ෂාවට ලක් වන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩි දියුණු කල යුතුය. මු.රෙ 103,104 ප්‍රකාරව සියලු කාලසීමාවන්ට අදාලව වැඩිපුර ගෙවන ලද මුදල් තක්සේරු කර නැවත අය කර ගැනීමට කටයුතු කල යුතු බව. . |
| (එ) | අංක 01-603326 හා 21-500158 මගින් සිවිල් හා වැන්දඹු ලෙස විශ්‍රාම වැටුප් 02 ක් ලබමින් සිට මිය ගිය විශ්‍රාමික නිලධාරිනියක් වෙත වැඩිපුර ගෙවා තිබුණු රු.2,696,303 ක් වූ විශ්‍රාම වැටුපෙන් 2020 දෙසැම්බර් 18 වන විටත් අයකර ගෙන නොතිබුණු මුදල රු. 2,388,251 ක් වී තිබුණි | මුදල ගෙවීම පැහැර හැරීම නිසා ඔහුට විරුද්ධව ගම්පහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලයේ අංක 118/18 යටතේ පැමිණිල්ලක් ගොනු කර අංක 24/2019 යටතේ නඩු පැවරූ බව ගම්පහ ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත. | වැඩිපුර ගෙවීම් සිදු නොවන පරිදි මිය යන විශ්‍රාමිකයන් පිලිබඳ තොරතුරු කඩිනමින් ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කරගත හැකි වනසේ වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතු බව හා මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර වගකිවයුත්තන් ගෙන් සිදු වූ අලාභය අයකර ගතයුතු බව**.** |
| (ඒ) | අංක 01- 600772 යටතේ විශ්‍රාම වැටුප් ලබමින් සිට 2013 නොවැම්බර් 07 දින මියගිය නිලධාරිණියගේ බැංකු ගිණුමට මිය ගොස් මාස 29 ක කාලයක් දක්වා රු.582,423 ක් විශ්‍රාම වැටුප් ප්‍රේෂණය කර තිබුණි. එයින් රු. 581,916 ක් ATM කාඩ්පතක් භාවිතා කරමින් ඉවත් කර ගෙන තිබූ නමුත් 2020 දෙසැම්බර් 31 වන විටත් එම මුදල් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි | මෙම වංචාව සිදු කළ පුද්ගලයාට එරෙහිව නීතිමය කටයුතු සිදු කිරීම සඳහා ගම්පහ විශේෂ අපරාධ ඒකකයේ පැමිණිල්ලක් ගොනු කර ඇත. පැමිණිලි අංකය - 119/19 (FCID) නඩු අංකය - B25/2019 . | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඹ) | දත්ත පද්ධතිය අනුව විශ්‍රාම වැටුප් අංක 21-0-105353 දරන විශ්‍රාමිකයා ගේ ජාතික හැඳුනුම්පත් අංකය වෙනුවට විශ්‍රාමිකයා ගේ දියණියගේ ජාතික හැඳුනුම්පත් අංකය යොදා විශ්‍රාමිකයා මිය ගොස් මාස 86 ක කාලයක් ගතවන තෙක් විශ්‍රාම වැටුප ලෙස රු. 1,562,470 ක් ගෙවා තිබුණි. එම මුදල් ඇයගේ දියණිය විසින් ලබාගෙන තිබුණු නමුත් මේ සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ග, හෝ විනය ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු විගණනයට ව වාර්තා නොවූ අතර මෙම වැඩිපුර ගෙවූ මුදලින් 2020 දෙසැම්බර් 31 දිනට රු. 1,166,336 ක මුදලක් තවදුරත් අය කර ගැනීමට පැවතිණි. | එම විශ්‍රාමිකයාගේ දියණිය විසින් මාසිකව රු. 20,000 බැගින් ගෙවමින් පවතින අතර 2020 දෙසැම්බර් මස වන විට තව දුරටත් අයවීමට ඇති ශේෂය රු. 1,116,336 කි. | -එම- |
| (ඕ) | ගල්නෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරිනියක විසින් හමුදා වැන්දඹුවකගේ ගිණුමට හිමිකම් නොමැති රු.1,596,640 ක් බැර කර එම මුදල් විශ්‍රාම වැටුප් නිලධාරිනිය විසින් ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර 2012 ඔක්තෝබර් 22 වනවිට රු. 1,000,000 ක මුදලක් නිලධාරීනිය විසින් ගල්නෑව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගෙවා තිබුණි. එම මුදලින් තවදුරත් අය කර ගැනීමට තිබූ මුදල් 2020 දෙසැම්බර් 31 වන විට ත් අයකරගෙන නොතිබුණි. | එම නිලධාරිනියට එරෙහිව විනය පරික්ෂණ පැවැත්වීම සඳහා 2020.09.30 දින කටයුතු ආරම්භ කර ඇති අතර නිලධාරිනියගේ පදිංචි ස්ථානය හා දුරකතන අංක වෙනස් කර තිබූ බැවින් අදාල තොරතුරු සොයා ගැනීමෙන් අනතුරුව ඇයගේ ඊකවරණ නිලධාරියාගේ අවසර ඉල්ලුම්පත්‍රය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස දැනුම් දී ඇතත් මේ වන තෙක් එම අවසර පත්‍රය යොමු කර නැත. | වගකිව යුතු නිලධාරින් සම්බන්ධව විධිමත් විනය පියවර ගත යුතු බව සහ වැඩිපුර ගෙවීම් අයකර ගතයුතු බව. |
| (ක ) | කුරුවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් දත්ත පද්ධතයේ දත්ත වෙනස් කරමින් හිග විශ්‍රාම වැටුප් ලෙස ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටි ගණකාධිකාරීවරයා විසින් 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු. 6,758,120 ක් ඔහුගේ ගිණුමට බැර කර ගෙන තිබුණි. මෙම මුදල් 2020 දෙසැම්බර් 31 වන විට අය කර නොතිබුණි. | එම ගණකාධිකාරිවරයා සේවයෙන් පහ කළ බව රත්නපුර දිස්ත්‍රික් ලේකම් දන්වා ඇත. | වංචා සම්බන්ධ වගකිව යුතු නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග අනුගමනය කර මුදල් රෙගුලාසි 103,104 ප්‍රකාරව වගකිවයුත්තන් ගෙන් සිදු වූ අලාභය අයකර ගතයුතු බව. |

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කල රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට වැඩ තහනම් කර ඇති, සේවය අතහැර ගොස් ඇති හා ස්ථාන මාරු වී ගිය නිලධාරින් 12 දෙනෙකුගෙන් අයකර ගත යුතු වර්ෂ 5 ට වැඩි කාලයක් හිඟ හිට පැවතින ශේෂය රු. 718,350 ක් වී තිබුණු අතර මෙම ශේෂ විගණන දිනය දක්වා නිරවුල් කරගෙන නොතිබුණි. | ස්ථාන මාරු වී ගිය_නිලධාරින් 4 කගේ ණය ශේෂ කපාහැරීම සඳහා ඉල්ලීම් ලිපියක් යවා ඇති අතර නිලධාරීන් දෙනෙකුගේ වර්තමාන තොරතුරු ඉල්ලා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කර ඇත. තවද එක් නිලධාරියකු අදාල ලිපිනයෙහි නොමැති බව වත්තල ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත.වැඩ තහනම් කර ඇති එක් නිලධාරියකුගේ වත්කම් පිළිබඳ වාර්තාව අනුව දේපල කිසිවක් නොමැති බව දැනුම් දී ඇති අතර එක් නිලධාරියකු වෙත ණය ශේෂය පියවන ලෙස නැවත දැනුම් දී ඇත. තවද නිලධාරින් දෙදෙනෙකු සම්බන්ධයෙන් විනය පරීක්ෂණ කටයුතු අවසන් වී නොමැත. සේවය අතහැර ගොස් ඇති නිලධාරිනිය විදේශගත වී ඇති බැවින් ණය ශේෂය අය කර ගැනීමට නීතිපති විමසීමට කටයුතු කර ඇත. | හිඟ හිට පැවතින ණය ශේෂ පියවා ගැනීමට කටයුතු කල යුතු බව . |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු. 168,586,842 ක්ද පාලන ගිණුම අනුව එම ශේෂය රු.168,558,187 ක් වූයෙන් එම ශේෂයන් අතර රු. 298,655 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වුවද දෙපාර්තමේන්තුව විසින් මු.රෙ 427/1 ප්‍රකාරව දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ සැසඳුම්කර වෙනසක් නොමැති බව, සහතික කර තිබුණද , මේ අනුව එය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | මෙම ශේෂ දෙපාර්තමේන්තුවේ දැනට සේවය කරන හා සේවය කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ වේ. මෙම හඳුනා ගත නොහැකි වූ ශේෂය පාලන ගිණුමට ගලපා භාණ්ඩාගාර පොත්වල ශේෂය, දෙපාර්තමේන්තු පොත්වල ශේෂය හා තුලනය කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් ලද උපදෙස් අනුව කටයුතු කර අවශ්‍ය අනුමැතිය ලැබීමෙන් පසුව නිරවුල් කිරීමට කටයුතු කරමි. | දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟද, දෙපාර්තමේන්තු පොත් අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව පාලන ගිණුම අනුව එම ශේෂය සමඟද සමාන විය යුතුය. වෙනසක් තිබේ නම් හේතු හඳුනා ගෙන ගැලපීමට කටයුතු කළ යුතු බව. |

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 සැලැසුම් කිරීම
---------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලාභීන්ට ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ලබාදීමට අමතරව අර්ධ රාජ්‍ය බැංකු සහ පෞද්ගලික අංශය සඳහා සේවක අර්ථ සාධක අරමුදලට අමතරව දායක විශ්‍රාම වැටුපක් හඳුන්වා දීම කල යුතු බවට 2020 අයවැය ඇස්තමේන්තුවේ දැක්වෙන සුවිශේෂ ප්‍රමුඛතා අනුව හඳුනාගෙන තිබුනද ක්‍රියාකාරී සැලැස්මෙහි එම ක්‍රියාකාරකම් ඇතුලත් කර නොතිබුණි. | වර්ෂය සඳහා නිශ්චිතව සැලසුම් කරන ලද කාර්යයන් ඇතුලත් කර ක්‍රියාකාරි සැලැස්ම සකස් කරනු ලැබේ. දායක විශ්‍රාම වැටුපක් හඳුන්වාදීම සඳහා වැඩසටහනක් 2020 ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන අවස්ථාවේදී සැලසුම් කර නොතිබූ බැවින් එම වැඩසටහන 2020 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම සඳහා නියෝගයක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මෙතෙක් ලැබී නැත. | අයවැය ඇස්තමේන්තුවේ දැක්වෙන සුවිශේෂ ප්‍රමුඛතා අනුව ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කළ යුතු බව. |

3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව
------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ රජයේ විගණන අංශය විසින් එක් එක් අංශයන්ගෙන් ලබාගත් තොරතුරු සැසඳීමේදී රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට අදාලව දෙසැම්බර් මස ලැබීම වටිනාකම වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව රු.61,399,468 ක් වුවද එම අංශයෙන් ලබාගත් තොරතුරු අනුව එය රු.61,457,155 ක් වූයෙන් රු.57,687 ක වෙනසක්ද, අප්‍රේල්, මැයි මාසවලට අදාලව ගෙවීම් වටිනාකම වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව රු.38,364,041 ක් සහ එම අංශයෙන් | මූල්‍ය ප්‍රකාශන සමඟ පෙබරවාරි මස 28 දිනට පෙර වාර්ෂික කාර්යසාධන වාර්තාව ලෙස ඉදිරිපත් කර තිබුණේ කෙටුම්පතක් පමණි. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්ෂික කාර්යසාධන වාර්තාව අඩුපාඩු රහිතව සකස් කර ඇත. | **විගණනය සඳහා ඉදිරිපත් කරන** මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ලබන වාර්ෂික කාර්යසාධන වාර්තාවට නිවැරදිව දත්ත ඇතුලත් කළ යුතු බව . |

ලබාගත් තොරතුරු අනුව රු.22,364,041 ක් වූයෙන් රු.16,000,000 ක වෙනසක්ද, පොලී අදායම වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව රු. 30,360,072,498 ක් වුවද එම අංශයෙන් ලබාගත් තොරතුරු අනුව එය රු.31,562,748,355 ක් වූයෙන් රු. 1,202,675,857 ක වෙනසක්ද, සිවිල් හා සන්නද්ධ සේවා පාරිතෝශික ගෙවීම් , වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව සංඛ්‍යාව 24,149 ක් හා වටිනාකම රු.26,237,294,814 ක් වුවද එම අංශයෙන් ලබාගත් තොරතුරු අනුව සංඛ්‍යාව 24,524 ක් හා වටිනාකම රු.26,808,301,923 ක් වූයෙන් සංඛ්‍යාවේ 375 ක් සහ වටිනාකමේ රු.571,007,109 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3.3 ප්‍රසම්පාදනයන්

---------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 701 (i) ප්‍රකාරව කොන්ත්‍රාත්තුව යන්නට නිම කිරීමේ කාලය හා ප්‍රමාද වෙනුවෙන් ප්‍රමාණ කල අලාභ වැනි කරුණු ඇතුළත්ව තිබිය යුතු බව දක්වා තිබූ නමුත් ඉදිකිරීම් කොන්ත්‍රාත් පිලිබද නියැදි පරීක්ෂාවේදී ගිවිසුම් ගත පිරිවැය රු.5,909,881 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 3 ක් පිලිබඳ කොන්ත්‍රාත් ගිවිසුම්වල මෙම වගන්තිය ඇතුලත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ඡේදය පරිදි පිරිවිතර සහ එකඟ වී ඇති වෙනත් නියම සහ කොන්දේසිවලට අනුකූල බවට සහතික කරමින් වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉංජිනේරුවරයා/උපදේශකවරයා විසින් නිකුත් කළ යුතු බව දක්වා තිබුණත් මෙම කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් එබදු සහතිකයක් නිකුත් කර නොතිබුණි. | ගිවිසුමෙහි 07 වගන්තිය මගින් අදාල කරුණු දක්වා ඇත. | මුදල් රෙගුලාසි 701 (i) ප්‍රකාරව කටයුතු කල යුතු බව. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 සඳහා වූ ව්‍යතිරේක (Supplementary) 35 හි 2 ඡේදය ප්‍රකාරව ඉදිකිරීමේ කොන්ත්‍රාත් සඳහා මිලගණන් කැඳවීම ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් සිදුකළ යුතු විය. නමුත් දෙපාර්තමේන්තුව විසින් කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ නවීකරණය හා නඩත්තු කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමේදී, දුරකථන නාමාවලියේ ඇති කහ පැහැති හා දේදුණු පැහැති පිටුවල සඳහන් ආයතනවලින් තෝරා ගත් කොන්ත්‍රාත්කරුවකුගෙන් මිල ගණන් 3 ක් කැඳවා තිබීම ,මිල ගණන් කැඳවීමේදී සම්මත මිල කැඳවීමේ ලේඛන භාවිතා කර නොතිබීම, කාර්යසාධන සුරක්ෂිතයක් ඉදිරිපත් කර නොතිබීම, කොන්ත්‍රාත් ගිවිසුම සම්මත මිල කැඳවීමේ ලේඛන අනුව ඉදිරිපත් කර නොතිබීම යන අඩු පාඩු නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී සීමිත මිල ගණන් කැඳවන ලද අතර ඒ අනුව දුරකතන නාමාවලියේ ඇති කහ පැහැති හා දේදුනු පැහැති පිටුවල සඳහන් ආයතන 06 කින් මිල ගණන් කැඳවන ලදී. තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයන්ට අනුව අවම මිල ගණන් ඉදිරිපත් කොට ඇති Irosh Construction ආයතනයට කොන්ත්‍රාත්තුව ලබා දී ඇත. මෙම ආයතනය මීට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් නිසි ප්‍රමිතියෙන් සිදුකර ඇත. ගෙවීම් කිරීමේදී 5% ක රඳවීම් මුදලක් රඳවා ගන්නා ලදී. ඉදිරියේදී කොන්ත්‍රාත් පිරිනැමීමේදී කාර්ය සාධන සුරක්ෂණයක් තබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ඉදිකිරීමේ කොන්ත්‍රාත් සඳහා මිලගණන් කැඳවීම සිදු කල යුතු බව. |

## 3.4 පාඩු හා හානි

-------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක එක අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වලින් තවදුරටත් අයකර ගත යුතු මුදල රු. මිලියන 521 ක් වී තිබුණි. මෙම ශේෂය, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. මිලියන 4.8 කින් ද, වර්ෂ 5 - 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රු. මිලියන 66 කින්ද, වර්ෂ 5 ක අඩු කාලයක් තුල අයකරගත යුතු රු. මිලියන 450 කින් ද සමන්විත විය. | **වාරිකයන්** ඔවුන් ලබන වෙනත් විශ්‍රාම වැටුප්, වයස, වැඩියෙන් ගෙවා ඇති වටිනාකම සහ ඉල්ලීම් යන කරුණු **මත** තීරණය **වන** බැවින් වැඩිපුර ගෙවීම් අය කර ගැනීමට කාල පමාවක් පවතී. | අයකර ගත යුතු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් අප්‍රමාදව අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු බව. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

**-------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අංක 4 – 50111 දරණ විශ්‍රාමිකයාගේ රු.6,855 ක් වූ මාසික යැපුම් දීමනාව රු.20,860 ක් බැගින් 2015 ජූලි 01 සිට 2020 අගෝස්තු 10 දක්වා කාලය තුල රු. 687,790 ක් වැඩිපුර ගෙවා තිබූ අතර 2021 ජූනි මස වන විට තවදුරටත් අයකළ යුතු මුදල රු.559,236 ක් වූ මුදල අයකර ගෙන නොතිබුණි. | විශ්‍රාමිකයා වෙත වැඩිපුර ගෙවන ලද සම්පූර්ණ යැපුම් දිමනාව රු.687,790 කි. 2020 සැප්තැම්බර් මස සිට 2021 ජූනි මස දක්වා ඔහුගේ විශාම වැටුප නවතා ඇති බැවින් හිඟ වැටුප වන රු.128,554 ක මුදල හිලව් වූ පසු තවදුරටත් අයකළ යුතු මුදල රු. 559,236 කි. මු.රෙ.104 පරික්ෂණයක් පවත්වන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත. | විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධව මුදල් රෙගුලාසි 103 104 පරිදි ක්‍රියාකර වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු බව . |
| (ආ) | කාර්යාල පරිශ්‍රයේ වර්ග අඩි 2868 ක් වූ බිම් ප්‍රමාණයක් කාර්යාල 5 කට කුලී පදනම මත ලබා දී තිබුණද කුලී ගිවිසුම්වලට එළඹ නොතිබුණ අතර කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන 4 ක කුලී ගිවිසුම් කාලය අවසන් වී තිබුණද, විගණන දිනය වන විටද එම ගිවිසුම් අළුත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තැපැල් කාර්යාලය සමඟ ගිවිසුමකට එළඹීමට දැනුවත් කර ඇත. රජයේ සේවා සපයන ආයතනක් ලෙස ග්‍රාම නිලධාරි කාර්යාල වෙතින් කුළී ගෙවීමට අපහසු බව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා එවා තිබේ. ලංකා බැංකු ටෙලර් යන්ත්‍රය සඳහා ගිවිසුමකට එළඹීමට ලංකා බැංකුව දැනුවත් කර ඇත. කුළී ගිවිසුම් කාලය අවසන් වී ඇති ආයතන වෙත ගිවිසුම් අළුත් කිරීමට කෙටුම්පත් ගිවිසුම අදාල ආයතන වෙත යොමු කර ඇත. | කාර්යාල පරිශ්‍රයේ කුලී පදනම මත ලබා දී ඇති ආයතන සමග කුලී ගිවිසුම්වලට එළඹ තිබිය යුතු බව. |
| (ඇ) | සෑම විශ්‍රාමිකයකු සඳහාම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වාගෙන යායුතු වුවද නියැදි පරීක්ෂාවලදී හෙලිදරවු වූ පරිදි තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 369 දෙනෙකුගේ විශ්‍රාම වැටුප් ලිපි ගොනු අස්ථානගත වී පැවතුනි. | විශ්‍රාම වැටුප් ලිපි ගොනු නොමැති 369 සඳහා තාවකාලික විශ්‍රාම වැටුප් ලිපිගොනු සකස් කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කරන මෙන් විශ්‍රාමිකයන් වෙත දන්වා ඇති බව ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. | විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ගොනු පවත් වාගෙන යාම සහ ආරක්ෂිතව තබා ගැනීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ කාර්යයක් වන බැවින් විශ්‍රාම වැටුප් නිලධාරින් අතර ලිපි ගොනු ලිඛිතව පවරා දීමත් ස්ථාන මාරුවීමකදී ඒවා නිසි |

| | | | |
|---|---|---|---|
| | | | පරිදි වෙනත් නිලධාරියකු වෙත පැවරීමක් කල යුතු බව, ගොනු ආරක්ෂිතව තබා නොගැනීම සම්බන්ධයෙන් නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියා මාර්ගයන් ගත යුතු වීම, සහ තාවකාලික ගොනු සකස් කර අනුමත කරවා ගත යුතු බව. |
| (ඉ) | විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියේ 2020 සැප්තැම්බර් මාසයේ ගෙවීම් දත්ත පද්ධතිය පරීක්ෂාවේදී 2017 ජනවාරි 01 දිනට පෙර විශ්‍රාම ගනු ලැබූ සියලුම රාජ්‍ය නිලධාරින්ගේ විශ්‍රාම වැටුප්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 සහ 14/2019 අනුව ගැලපීම, 2019 ජූනි 11 දිනැති අංක 01/2019 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මගින් 2019 ජුලි 01 දින සිට සිදු කල යුතුව තිබුණද ජාතික හැඳුනුම්පත් අංක නොමැති වීම, යුද්ධය හා වෙනත් හේතු නිසා ලිපිගොනු අස්ථානගත වීම, වැටුප් සම්බන්ධ ගැටළු වැනි හේතු නිසා 2021 ජනවාරි 13 දින වන විට විශ්‍රාම වැටුප් සංශෝධනය නොකල ලිපිගොනු සංඛ්‍යාව 39,373 ක් වී තිබුණි. | විශ්‍රාමිකයන් 479,415 කගේ විශ්‍රාම වැටුප් පරිවර්තනය කර ඇති අතර විශ්‍රාමිකයන් 39,373 පරිවර්තනය කර නොමැත. ලිපිගොනු වල විවිධ අඩුපාඩු පැවතීම නිසා එම ගැලපීම ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය කරමි. (ජාතික හැඳුනුම්පත් අංක නොමැති වීම, යුද්ධය හා වෙනත් හේතු නිසා ලිපිගොනු අස්ථානගත වීම, වැටුප් සම්බන්ධ ගැටළු) | චක්‍රලේඛය විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව . |

## 3.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වා ගැනිමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිලිබඳ නිවැරදි තොරතුරු නොමැතිවීම හේතුවෙන් වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා හිමිකම් හා දායක මුදල් ආපසු ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමිගැන්විමේදී දායක මුදල් නිශ්චිතව, අඛණ්ඩව ලැබුනේද යන්න දෙපාර්තමේන්තුව තුලින් තහවුරු කර ගැනිමට නොහැකි වී තිබුණි. | සියලුම රාජ්‍ය නිලධාරින්ගේ දත්ත මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඇතුලත් කළ හැකි වැඩසටහනක් 2017 ඔක්තෝබර් මස සිට හඳුන්වා දී ඇතත් අනෙකුත් ආයතනයන්හි සහය නොමැති වීමෙන් ක්‍රියාත්මක කිරීම අකර්ණමාා වී ඇත. අය කර ගැනීම් විස්තරයක් අවසානයට සේවය කල ආයතනයෙන් සහතික කිරීමෙන් පසුව විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ **කිරීම** සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙන්වා ගනු ලබන අතර ආපසු ගෙවීමේ දී නියමිත ප්‍රතිශතයට අදාලව අයකරගෙන ඇත්දැයි පරික්ෂා කරනු ලබයි. | දායකයින් හා දායක ගෙවීම් පිළිබඳ දත්ත පද්ධතියක් සම්බන්ධිත ආයතනවල සහයෝගය ඇතිව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගැනිමට පියවර ගත යුතු බව . |

# 4. යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව සැලසුම් කරන ලද, මූල්‍ය පාලන ක්‍රමවේදය පිළිබඳව මූලික පරීක්ෂාව, නිවාඩු සහ අතිකාල පරීක්ෂාව, මහජන පැමිණිලි පෙත්සම් සම්බන්ධව කටයුතු කිරීම වැනි ක්‍රියාකාරකම් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් නොවුණි. තවද 2020 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ආදායම් එකතුවීම් පරීක්ෂාව, පුහුණුවීම් සම්බන්ධ ක්‍රියාවලිය පරීක්ෂාව,ඉදිකිරීමේ කොන්ත්‍රාත් හා මිලදීගැනීම් පරීක්ෂාව යනාදී ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ආසන්න වශයෙන් රුපියල් බිලියන 240 ක් පමණ වැයකරන බැවින් මෙම ගෙවීම් පිළිබඳව වැඩි අවදානමක් පැවතීමෙන් අභ්‍යන්තර විගණනයේදී මේ පිළිබඳව වැඩි බර තැබීමක් කර ඇත. එහෙත් රජයේ විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි විගණන සැලැස්මට ඇතුලත් කර විගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | අභ්‍යන්තර විගණන සැලැස්ම දෙපාර්තමේන්තුවේ සියලු ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි සකස් කල යුතු බව . |

**4.2 විගණන හා කළමනාකරණ කමිටුව**

**--------------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු එකක් පමණක් පවත්වා තිබුණි. | 2020 වර්ෂයේදී COVID වසංගත තත්වය හේතුවෙන් සැලසුම් කල විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. 2021 පළමු කාර්තුවට අදාල විගණන හා කළමණාකරන කමිටු රැස්වීම 2021.04.30 දින පවත්වා ඇත. | වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු වාර 4 ක් පවත්වා තිබිය යුතු බව |